# රිතූ තේ කෝප්පය සහ රිතූ තරුව



නිහංසා කිත්මිණි

# රතු තේ කෝප්පය
# සහ
# රතු තරුව

නිහංසා කිත්මිණි

**රතු තේ කෝප්පය සහ රතු තරුව**

කර්තෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2023 නොවැම්බර්

කතාව සහ චිත්‍ර

**නිහංසා කිත්මිණී**

4 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-937-1

Bar Code

9 786242 069371

# පිදුම

මාගේ පළමු ශ්‍රේණියේ සිටි

ගයානි ගුරු මෑණියන්ටත්

මාගේ හතරවන ශ්‍රේණියේ සිටින

සමන්මලී ගුරු මෑණියන්ටත්

මේ පොත පුද කරමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

එක ගමක වෙළඳ පොළක් තිබුණා. එහි එක කඩයක රතුපාට කෝප්පයක් සහ රතු තරුවක් තිබුණා ඒ කඩයේ ඉතුරුවෙලා තිබුණේ මේ දෙක විතරයි.





මේ දෙක පුංචි ළමයෙක් ගත්තා. ඒ ළමයා මේ දෙක පැන්ට්‍රි කබඩ් එකට දැම්මා. ඊට පස්සේ උදේ එයා තේ බොන්න කෝප්පය සේදුවා. එතකොට එයාගෙ අම්මා එයාට එන්න කියලා මෙහෙම කිවුවා.

"පුතේ ඔය කෝප්පය පරිස්සම් කරන්න."

"හරි අම්මේ අම්ම කියපු කතාවත් ඇත්ත. මම මේක කබඩ් එකට දානවා.



මම මගේ පරණ කෝප්පය ගන්නවා."


ඔය වගේ දවස් පහක් විතර ගෙවුනා. හයවැනි දවසේ පරණ කෝප්පය කැඩුණා. මම අලුත් කෝප්පය පරිස්සමෙන් පාවිච්චි කරන්න ඕන.



“පුතේ පුතේ”

“ආ ඇයි අම්මේ”
“අර තරුව කොහෙද පුතේ?”
“ඒක මගේ Pencil Box එකේ”
“අනේ පුතේ මට පෙන්නනවද?”
“හා අම්මේ එන්න මේ

තියෙන්නේ”



“හොඳයි පුතේ මම යනවා.”

ටිං ටිං ! ටිනිං ටිං

උදේ හයත් වෙලා. "අම්මේ මට

තේ ටිකක් හදල දෙනවද?

"හා පුතේ පුතාගෙ රතු

කෝප්පය කොහෙද?"



අම්මේ කෝප්පය

පැන්ට්‍රි කබඩ් එකේ

ඇති. "

"ආ ඔව් තියෙනවා

පුතේ"

“අම්මේ එහෙනං මම මුහුණ
සෝදගෙන එන්නම්”
“හරි පුතේ”
ෂ්ෂ්ෂ්ෂ් ම්ම් අද නම් මගේ
මුහුණ සුදු වෙලා. හරි දැං මම
මුහුණ සෝදලා ඉවර නිසා තේ
බොන්න යනවා.
“අම්මේ තේ ටික දෙනවද?
“හරි පුතේ . ආ තේ ටික.”
“දෙන්න අම්මේ”
“මේ පුතේ මා වැඩ කරන


තැනට  තරුවක් ගේන්න

කිවුවා. ඔයාගේ අර තරුව

මට දෙනවද?”

“හා අම්මේ. ආ අම්මේ”

“ස්තුතියි පුතේ”



“අම්මේ තරුව පරිස්සම්

කරන්න.”

“හරි පුතේ මම වැඩට  යනවා”

"හරි අම්මේ බුදු සරණයි"
"බුදු සරණයි පුතේ"

මම දැන් බුදුන් වඳින්න ඕනි.




දැන්නම් රෑ වෙලා.
හොඳ වෙලාවට මම අලුත්
කෝප්පය පරිස්සමින් අරන්
තියලා තිබ්බේ.
ඒ හින්ද අද රස තේ එකක්
බිව්වා අලුත් කොප්පයේ.
එදා කඩෙන් ගත්ත රතු
තරුව පරිස්සම් කළ නිසා
අම්මට අද දෙන්න පුළුවන්
වුණා.

බලන්න මං හොඳ ළමයෙක්

නේද? ළමයා ට හිතුණා.

එයා සතුටින් නින්දට ගියා



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20